සියලුම හිමිකම් ඇවිරිණි

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය 2020**

| | | | | |
|---|---|---|---|---|
| **ආර්ථික විද්‍යාව I**<br>**ECONOMICS I** | **21** | **S** | **I** | **පැය දෙකයි** |

විභාග අංකය :- ...................................................

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

01. "හිඟකම" පිළිබඳ ප්‍රශ්නය

1) මිශ්‍ර ආර්ථික ක්‍රමයක් පවත්නා රටවල පමණක් දැකිය හැකිය.
2) මිල ගණන් පහළ දැමීමට හැකිනම් මුළුමනින්ම තුරන් කල හැකිය.
3) හිඟකම යනු සමහර භාණ්ඩ හිඟ බවයි.
4) පැන නගින්නේ පවත්නා සම්පත් වලින් මිනිස් වුවමනා සපුරා ගත නොහැකි බැවිනි.
5) ආර්ථික වෘද්ධිය තුළින් විසඳා ගත හැකි බවයි.


02. පෞද්ගලික විශ්ව විද්‍යාලයක ඉගෙනීමේ ආවස්ථික පිරිවැයක් නොවන්නේ

1) පාඨ ග්‍රන්ථ මිලට ගැනීමේ වියදමයි.
2) පාඨමාලා ගාස්තුවයි.
3) උපයාගත හැකිව තිබූ ආදායම අහිමි වීමයි.
4) අසනීපයක් වෙනුවෙන් බෙහෙත් මිලදී ගැනීමට දැරූ වියදම.
5) පෑන්,පැන්සල් හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට දරන වියදම.

03. ආර්ථික භාණ්ඩයක් යනු

1) නිෂ්පාදනයේ දී ආවස්ථික පිරිවැයක් හටගන්නා භාණ්ඩයකි.
2) නිෂ්පාදනයේ දී සම්පත් උපයෝජනය නොකරන භාණ්ඩයකි.
3) තරඟකාරී ලෙස සපයනු ලබන භාණ්ඩයකි.
4) නිෂ්පාදනයේ දී ලාභයක් උපයන භාණ්ඩයකි.
5) ශුන්‍ය මිලක දී වුවද ලබා ගත හැකි භාණ්ඩයකි.

04.




X භාණ්ඩයේ තාක්ෂණික දියුණුවක් නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය K සිට L දක්වා විතැන් වී ඇත. ඒ අනුව X භාණ්ඩය O සිට Q ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය Y භාණ්ඩ ඒකක වලින්

1) JO  2) KL  3) MN  4) MJ  5) OM

05. නිෂ්පාදන සාධක වල පොදු හිමිකම, තීරණ ගැනීමේ කේන්ද්‍රගත වීම යන ලක්ෂණ වලින් සමන්විත ආර්ථික පද්ධතිය

1) වෙළඳපල ආර්ථිකයයි.
2) සම්ප්‍රදායික ආර්ථිකයයි.
3) සමාජීය වෙළඳපළ ආර්ථිකයයි.
4) මධ්‍ය සැලසුම් සහිත ආර්ථිකයයි.
5) ධනවාදී ආර්ථික පද්ධතියයි.

06. වෙළඳපල ආර්ථික පද්ධතියක් තුළ මිල ගණන් වල ප්‍රධාන කාර්යයක් වනුයේ

1) සාධාරණත්වය ඇති කිරීම.
2) පූර්ණ සේවා නියුක්තිය තහවුරු කිරීම.
3) හුවමාරුව පහසු කිරීම.
4) මිල ගණන් ස්ථාවරව තබා ගැනීම.
5) හිඟ සම්පත් බෙදා වෙන් කිරීම.

07. සමාජවාදී ආර්ථික පද්ධතියක් සමාජීය වෙළඳපළ ආර්ථික පද්ධතියකින් වෙනස් වන්නේ

1) දේපල හිමිකාරිත්වය මතයි.
2) සමාජ සාධාරණත්වය සඳහා රජය ඉටු කරන කාර්ය භාරය මතයි.
3) තීරණ ගන්නා යාන්ත්‍රණය මතයි.
4) සානුබල පද්ධතිය මතයි.
5) සම්පත් බෙදා වෙන් කෙරෙන යාන්ත්‍රණය මතයි.

08. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් විම සිදු විය හැක්කේ

1) කිට්ටු ආදේශක භාණ්ඩයක මිල පහත වැටීම නිසාය.
2) එම භාණ්ඩයේ මිල පහල වැටීම නිසාය.
3) ආදායම ඉහළ නැඟීම නිසාය.
4) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යාම නිසාය.
5) නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසාය.


09. එක්තරා නිෂ්පාදන ආයතනයක් විසින් නිපදවනු ලබන භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය 0.6 ක් වේ.නිෂ්පාදන ආයතනය විසින් එම භාණ්ඩයේ මිල ඉහළ නංවනු ලැබුව හොත් ආයතනයේ අය භාරය

1) ඉහළ නගී.
2) පහළ බසී.
3) නොවෙනස්ව පවතී
4) 6% කට වඩා වැඩි ප්‍රමාණයකින් පහළ බසී.
5) 6% කට වඩා අඩු ප්‍රමාණයකින් පහළ බසී.

10. මිල ඉල්ලුම් නම්‍යතාවය ශුන්‍ය අගයක් වන කිසියම් භාණ්ඩයක නිමැවුම මත පනවනු ලබන ඕනෑම බද්දක්

1) සැපයුම් වක්‍රයෙහි වෙනසක් ඇති නොකරයි.
2) සැපයුම් වක්‍රය දකුණට විතැන් කරයි.
3) ඉල්ලුම් වක්‍රය දකුණය විතැන් කරයි.
4) මුළුමනින්ම නිෂ්පාදකයා දරයි.
5) බද්දේ ප්‍රමාණයෙන් භාණ්ඩයේ මිල ඉහළ නංවයි.

11. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කෙරෙන්නේ කිසියම් භාණ්ඩයක් සඳහා පවතින වෙළඳපළ තත්වය වේ.




මෙම භාණ්ඩය OM ප්‍රමාණයම මිලක් අය නොකර සැපයීමට තීරණය කළහොත් පාරිභෝගික අතිරික්තය වන්නේ

1) A ප්‍රමාණයයි. 2) A B C ප්‍රමාණයයි. 3) C ප්‍රමාණයයි.
4) B C ප්‍රමාණයයි. 5) A C ප්‍රමාණයයි.

12. පුද්ගලයකුගේ ආදායම 20%කින් ඉහළ යන විට යම් භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාවය -----0.6 ක් විය.මේ තත්වය යටතේ එම භාණ්ඩයේ ඉල්ලුම් ඒකක 1400 සිට කොපමණ ප්‍රමාණයකින් වෙනස් කරයිද?

1) ඒකක 168 කින් පහල දමයි.
2) ඒකක 840 කින් පහළ දමයි.
3) ඒකක 1568 දක්වා ඉහළ නංවයි.
4) ඒකක 1388 දක්වා පහළ දමයි.
5) ඒකක 168 කින් ඉහළ නංවයි.

13. නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව හැසිරෙන ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද?

1) ආන්තික ඵලදාව උපරිම වේ.
2) ආන්තික ඵලදාව ධන අගයක් ගනී.
3) ආන්තික ඵලදාව ශුන්‍ය වේ.
4) ආන්තික ඵලදාව සෘණ අගයක් ගනී.
5) ආන්තික ඵලදාව අවම වේ.

14. කිසියම් නිෂ්පාදන ආයතනයක නිමැවුම හා පිරිවැය පිළිබඳව පහත දැක්වෙන තොරතුරු සපයා ඇත.

| නිමවුම් (ඒකක) Q | මුළු පිරිවැය (රු.) TC |
|---|---|
| 0 | 100 |
| 1 | 160 |
| 2 | 180 |
| 3 | 190 |
| 4 | 210 |


ඉහත ආයතනයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි නිවැරදි පිළිතුර කුමක්ද?

1) නිමවුම ඒකක 0 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 0 කි.
2) නිමවුම ඒකක 2 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 50 කි.
3) නිමවුම ඒකක 4 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 60 කි.
4) නිමවුම ඒකක 3 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 100 කි.
5) නිමවුම ඒකක 4 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 110 කි.

15. පූර්ණ තරඟය සමඟ අනුකූල නොවනුයේ පහත සඳහන් කරුණු අතරින් කවරෙක්ද?

1) වෙළඳපළ තුළ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් විශාල සංඛ්‍යාවක් සිටීම.
2) එක් එක් ආයතනය ප්‍රචාරණයේ යෙදීම.
3) වෙළඳපලෙහි එක් මිලක් පමණක් පැවතීම.
4) නිෂ්පාදිතය සමජාතීය වීම.
5) සෑම ආයතනයක් සතුවම පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් පැවතීම.

16. පහත රූප සටහනින් දැක්වෙන්නේ X භාණ්ඩය සඳහා ඒකක බද්දක් පැනවීමෙන් පසු වෙළඳපළ තත්වයයි.




බද්ද පැනවීම නිසා අහිමිවූ සුභසාධනය දැක්වෙන අක්ෂරය වන්නේ

1) A ,B 2) B , C 3) D ,E 4) G , F 5) F , E

17. ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතන විශාල සංඛ්‍යාවක් දක්නට ලැබෙන වෙළඳපළ ව්‍යුහය වනුයේ

1) පූර්ණ තරඟකාරි වෙළඳපළ 2) ඒකාධිකාරි වෙළඳපළ
3) කතිපයාධිකාරි වෙළඳපළ 4) ඒකාධිකාරි තරඟ වෙළඳපළ
5) තරඟකාරි වෙළඳපළ

18. ව්‍යාපාර චක්‍රයක ප්‍රතිගමනාත්මක අදියරේදී සිදුවීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇත්තේ

1) මූර්ත දළදේශීය නිෂ්පාදිතය පහළ යාම. 2) මූර්ත දළදේශීය නිෂ්පාදිතය ඉහළ යාම.
3) උද්ධමනය පහළ යාම. 4) සේවා නියුක්තිය ඉහළ යාම.
5) සේවා වියුක්තිය පහළ යාම

19. සාර්ව ආර්ථික අරමුණු වලට අයත් නොවන්නේ

1) ආර්ථික වර්ධනය 2) පූර්ණ සේවා නියුක්තිය
3) සාධාරණත්වය 4) තිරසර සංවර්ධනය
5) පොදු මිල මට්ටම

20. ජාතික ගිණුම්කරණයේ දී නිෂ්පාදන ඇතුලත් නොකරන්නේ

1) ජලය සපයා ගැනීම.
2) නිවසේ සාමාජිකයින්ට ආහාර සැපයීම.
3) තමන් සතු පදිංචිව සිටින නිවසෙන් ලබා දෙන සේවය
4) කෘෂි නිෂ්පාදන සැපයීම.
5) රෙදි විවීම,ඇඳුම් මසා ගැනීම.

21. කිසියම් කාලපරිච්ඡේදයක ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගි වන්නන්ගේ සියළුම නිෂ්පාදන සාධක වලට ලැබෙන ආදායමට සමබර ප්‍රාග්ධන පාරිභෝජනය එකතු කිරීමෙන් ලැබෙනුයේ

1) ශුද්ධ දේශීය ආදායමයි. 2) දළ ජාතික ආදායමයි.
3) දළ දේශීය ආදායමයි. 4) විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායමයි.
5) ශුද්ධ දේශීය නිෂ්පාදිතයයි.

22.සැබවින්ම භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සඳහා වියදම් කරන්නේ කවරෙක්ද යන්න නොසලකා ගණනය කරන වියදම

1) කුටුම්භ පරිභෝජන වියදම. 2) රාජ්‍ය පරිභෝජන වියදම
3) සත්‍ය සුවිනිශ්චිත පරිභෝජන වියදම. 4) අවසාන පාරිභෝජන වියදම.
5) දළ දේශීය වියදම.


23.කිසියම් ආර්ථිකයක පහත තොරතුරු ඔබට සපයා ඇත.

ආයෝජනය - 225
ස්වාධීන පරිභෝජනය - 150
ආන්තික පරිභෝජනය - 0.75 නම්

මෙම ආර්ථිකයේ සමතුලිත නිමවුම වන්නේ

1) 1260 2) 3750 3) 2600 4) 4255 5) 1500

24.පහත දැක්වෙන්නේ සරල ආර්ථිකයක පාරිභෝජන වියදම හා වැයකල හැකි ආදායම අතර සම්බන්ධය තුලින් සමතුලිතය නිර්මාණය වී ඇති ප්‍රස්තාර සටහනකි.




එහි A කොටසින් දැක්වෙන්නේ

1) ධන ඉතුරුම්ය.
2) සෘණ ඉතුරුම්ය.
3) අය පාරිභෝජනයක්ය.
4) ඌණ ඉල්ලුමක්ය.
5) ඌණ ආයෝජනයන්ය.

25. එක්තරා ආර්ථිකයක ස්වායත්ත වියදම් රුපියල් මිලියන 100 කින් ඉහළ යන විට මූර්ත දළ දේශිය නිෂ්පාදිතය රුපියල් මිලියන 500 කින් ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ ආන්තික පාරිභෝජන නැමියාව විය යුත්තේ

1) 0.2 2) 0.4 3) 0.5 4) 0.8 5) 5.0

26.සංවෘත ආර්ථිකයක් පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

Y - 1400 C - 700 I - 300
T - 300 Tr - 100

මෙම ආර්ථිකයේ මුළු කාන්දුවීම් ප්‍රමාණය වන්නේ

1) 500 2) 400 3) 1000 4) 1300 5) 600

27. මුදල් සැපයුම ගණනය කිරීමේ දී ඇතුලත් නොවන්නේ

1) මහජනයා සතු ව්‍යවහාර මුදල්
2) මහ බැංකුවේ ඇති වාණිජ බැංකු වල කාලීන හා ඉතුරුම් තැන්පත්
3) මහජනයා සතු වාණිජ බැංකු වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පත්
4) මහජනයා සතු වාණිජ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පත්
5) විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල නේවාසිකයන් සතු තැන්පත්

28. මුදල් සැපයුම ප්‍රසාරණය කිරීමට මහ බැංකුව අනුගමනය කල යුතු වන්නේ

1) විවෘත වෙළඳපලේ සුරැකුම්පත් මිලදී ගැනීම.

2) බැංකු පොලී අනුපාතය විචලනය කිරීම.
3) සංචිත අනුපාතය ඉහළ නැංවීම.
4) ඒක්ෂණ ණය වෙළඳපොලේ ප්‍රති මිලදී ගැනුම් ක්‍රියාත්මක කිරීම.
5) ඒක්ෂණ ණය වෙළඳපොලේ ප්‍රති විකුණුම් ක්‍රියාත්මක කිරීම.

29. ආර්ථිකයක සැබෑ නිමැවුම් මට්ටම විභව නිමැවුම් මට්ටම ඉක්මවන විට හට ගත හැකි ප්‍රතිවිපාකය වනුයේ

1) උද්ධමන පරතරයක් බිහිවීම.
2) මිල මට්ටම පහළ යාම.
3) සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන් වීම.
4) මූර්ත වැටුප් පහළ යාම.
5) විභව නිෂ්පාදන හැකියාව පහළ යාම.

30.වැටුප් වැඩි වීමක් උද්ධමන බලපෑම් ඇති නොකිරීමට නම්

1) ශ්‍රම ඵලදායීතාවය ඉහළ යා යුතුය.
2) නිෂ්පාදකයින් තම ලාභ ආන්තික වෙනස් නොකල යුතුය.
3) ඉතුරුම් පහළ යා යුතුය.
4) ආයෝජන ඉල්ලුම ඉහළ යා යුතුය.
5) නිෂ්පාදන ප්‍රමාණය මත වැටුප් අනුපාත ගැලපිය යුතුය.

31. ආරක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම, ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමෙන් වෙනස් වන්නේ

1) ආදායම සමඟ අනුලෝමව වෙනස් වන බැවිනි.
2) ආදායම් ලැබීමේ කාල පරතරයක් පවතින බැවිනි.
3) ගනුදෙනු,මුදල් ඉල්ලුමට වඩා ආවස්ථික පිරිවැය ඉහළ බැවිනි.
4) කල්තබා පුරෝකතනය කල නොහැකි වියදම් හා බැඳී පවතින බැවිනි.
5) ආදායම සමඟ ප්‍රතිලෝමව වෙනස්වන බැවිනි.

32.පදනම් මුදල් වැඩි වන විට මුදල් සැපයුම ඉහළ යාමට හේතුව,

1) වාණිජ බැංකුවල ණය ප්‍රසාරණ හැකියාව ඉහළ යාම.
2) ගනුදෙනු සංඛ්‍යාව ඉහළ යාම.
3) ඉල්ලුම් තැන්පතු වලට වඩා ව්‍යවහාර මුදල් ඉහළ යාම.
4) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය අඩු වීම.
5) මුදල් සැපයුම හා හුවමාරුව අතර ධන සම්බන්ධතාවයක් පැවතීම.

33. පහත දැක්වෙන දෑ අතරින් ද්‍රවශීලතාවයෙන් අඩුම වත්කම වනුයේ

1) ඉල්ලුම් තැන්පතු
2) මූර්ත දේපල
3) භාණ්ඩාගාර බිල්පත්
4) ඉතුරුම් තැන්පත්
5) ආණ්ඩුවේ තිළිණපත්

34. ශ්‍රී ලංකා මහා බැංකුවේ අරමුණක් වශයෙන් මිල ස්ථායිතාවය ළඟා කර ගැනීම යනුවෙන් අදහස් කරන්නේ

1) උද්ධමන අනුපාතය ශූන්‍ය වීම.
2) ව්‍යවහාර මුදලේ අගය ආරක්ෂා වීම.
3) මිල දර්ශනය කෙටි කාලීනව ස්ථාවරව පැවතීම.
4) පොලී අනුපාතිකය පහළ මට්ටමක පැවතීම.
5) මූල්‍ය ක්‍රමය බාහිර කම්පනයන්ගෙන් නොසැලකීම.

35. රු.20000 ක නව තැන්පතුවක් විවෘත කිරීම නිසා 25% ක සංචිත අවශ්‍යතාවයක් සහිත වාණිජ බැංකු පද්ධතියකට මුදල් සැපයුම උපරිම වශයෙන් වැඩි කල හැක්කේ කොපමණ ප්‍රමාණයකින්ද ?

1) රු. 20000
2) රු.100000
3) රු. 60000
4) රු 25000
5) රු. 80000

36. ද්‍රවශීල වත්කම් ලග තබා ගැනීම එතරම් ලාභදායි නොවේ.එසේ නම් වාණිජ බැංකු සිය වත්කම් වලින් කොටසක් ද්‍රවශීල වත්කම් ලෙස ලග තබා ගන්නේ,

1) ගනුදෙනුකරුවන් ඉල්ලූ විට ආපසු ලබා දීමටය.
2) සමපේක්ෂණ කාර්යන් සඳහා .
3) බැංකු ලාභ උපරිම කිරීමක් බලාපොරොත්තු නොකරන නිසා .

4) කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම සඳහා .

5) තම තැන්පතුවල සුරක්ෂිතභාවය පිළිබඳ ගනුදෙනුකරුවන් තුළ විශ්වාසයක් ගොඩනැගීම සඳහා.

37.ආර්ථික අරමුණක් වශයෙන් සාර්ව ආර්ථික ස්ථායිතාවය යන්නට ඔබ ඇතුලත් කරන්නේ කුමක්ද?

1) සෑම විටම ඉතුරුම් හා ආයෝජන සමව පවත්වාගෙන යාම.
2) මිල ස්ථායිතාවය පවත්වා ගැනීම.
3) රාජ්‍ය අයවැය හිඟය වලක්වා ගැනීම.
4) බාහිර ගිණුම්වල තුලනයක් පවත්වා ගැනීම.
5) තුලිත අයවැය ලේඛනයක් පවත්වා ගැනීම.

38. සුබසාධනයට අහිකතර භාණ්ඩ වල ලක්ෂණයක් වන්නේ

1) ධන බාහිරතා බිහි කිරීම.
2) කළු කඩයෙන් පමණක් ලබා ගත හැකි වීම.
3) වෙළඳපළ ක්‍රමය යටතේ අධි පාරිභෝජනයක් පැවතීම.
4) නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී බාහිර පිරිවැයක් ඇති නොවීම.
5) පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා සමාජ ප්‍රතිලාභ පැවතීම.

39. ශ්‍රී ලංකාවේ ආදායමේ ප්‍රධාන මූලාශ්‍ර වනුයේ,

1) බදු වර්ග සහ බදු නොවන මාර්ග.
2) දේශීය මූලාශ්‍ර සහ විදේශීය මූලාශ්‍ර.
3) විදේශ ප්‍රධාන සහ ණය.
4) වෙළඳපළ මූලාශ්‍ර සහ වෙළඳපළ නොවන මූලාශ්‍ර.
5) රජයේ දේපල විකිණීමෙන් ලබන ආදායම.

40. දියුණු වෙමින් පවතින රටවලට ලැබෙන විදේශ සෘජු ආයෝජන නිසා

1) දේශීය වැටුප් මට්ටම පහළ වැටේ.
2) සංවර්ධනය වෙමින් පවතින රටවල බදු ආදායම අඩු වේ.
3) ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුම බැර වේ.
4) දේශීය ජනතාවට ලබා ගත හැකි විවිධ පාරිභෝජන භාණ්ඩ සංඛ්‍යාව අඩු වේ.
5) ආයෝජනයෙන් ලැබෙන ශුද්ධ විදේශ ආදායම් ප්‍රවාහ අයහපත් වේ.

41. ගෙවුම් ශේෂයේ හට ගන්නා තාවකාලික අසමතුලිතාවයන්ට මුහුණ දීම සඳහා නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් යටතේ යොදා ගන්නා ප්‍රාථමික යාන්ත්‍රණය වන්නේ,

1) දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
2) දැඩි විනිමය පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම.
3) විනිමය අතිරික්ත ඇති රටවල සිට හිඟ රටවලට මුදල් ගලා යාම.
4) විනිමය අනුපාතිකය ක්ෂය වීමට හෝ අගය ඉහළ යෑමට සැලැස්වීම.
5) විනිමය අනුපාතිකය අවප්‍රමාණය හෝ ප්‍රතිමාණය කිරීම.

42. ආර්ථික වෘද්ධියක් ඇති වන්නේ

1) සේවා නියුක්තිය ඉහළ යෑමේ දී .
2) නිෂ්පාදන ධාරිතාව වැඩි වීම නිසා .
3) සමහාර ඉල්ලුම වැඩි වීම නිසා.
4) ඉතුරුම් වැඩි වීම නිසා.
5) උද්ධමන අනුපාතය පහළ යැම නිසා.

43. කිසියම් රටක ප්‍රජා විද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දැක්වේ. සියළුම දත්ත මිලියන වලිනි.

- ජන සංඛ්‍යාව - 75
- වැඩ කල හැකි වයසේ ජන සංඛ්‍යාව - 60
- ශ්‍රම හමුදාවේ ප්‍රමාණය - 45
- සේවා නියුක්ත සංඛ්‍යාව - 40
- සේවා වියුක්ත සංඛ්‍යාව - 05

මෙම දත්ත වලට අනුව නිවැරදි පිළිතුර වන්නේ

| පිළිතුර | ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතය % | සේවා නියුක්ති % | සේවා වියුක්ති % |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 1 | 75% | 45% | 5% |
| 2 | 60% | 53% | 47% |
| 3 | 75% | 88.9% | 11.1% |
| 4 | 75% | 80% | 20% |
| 5 | 60% | 89% | 11% |

44. වේගවත් ආර්ථික වර්ධනයක් ජනනය කිරීමට වැඩි හැකියාවක් ඇති සාධක සංයෝගයක් වන්නේ
    1) ආයෝජන මට්ටමත් වැඩ කරන ජනගහනයත් ඉහළ යාම.
    2) සේවා නියුක්තියත්, ගෙවුම් ශේෂ හිඟයත් ඉහළ යාම.
    3) උද්ධමනය වේගවත් වීම සහ ජාතික ණය ප්‍රමාණය පහළ යාම.
    4) ධනය වඩාත් සමාන ලෙස බෙදී යාම සහ සංක්‍රාම ගෙවීම ඉහළ මට්ටමක පැවතීම.
    5) විදේශ සෘජු ආයෝජනය හා පොළී අනුපාතිකය ඉහළ යාම.

45. රටක් සංවර්ධනය වී ඇති බව හැඟවෙන්නේ කුමන ප්‍රකාශය මඟින්ද?
    1) දේශීය මුදලේ විදේශීය අගය ඉහල යාම.
    2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.
    3) රටෙහි වෙළඳ ශේෂයේ දියුණුවක් ඇති වීම.
    4) රටෙහි පුරවැසියන්ගේ ගුණාත්මක තත්වයේ දියුණුවක් ඇති වීම.
    5) දේශීය මුදලේ විදේශීය අගය ඉහළ යාම.

46. කිසියම් කල්පිත ආර්ථිකයක මුළු සාමාන්‍ය මාසික ආදායමෙන් පහළ ආදායම් ලබන පංතියේ සාමාන්‍ය මාසික ආදායම 8211 ක්ද, ඉහළ ආදායම් ලබන පංතියේ සාමාන්‍ය මාසික ආදායම 98575 ක්ද වේ නම් මෙම ආර්ථිකයේ පංචමක අපකිරණ අනුපාතය වන්නේ ,
    1) 10.6 2) 12.0 3) 16.4 4) 18 5) 21.0

47. දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකයේ නිර්ණායකයකන් නොවන්නේ
    1) ආර්ථික සානු බලය හා ආර්ථික ව්‍යුහය
    2) නව්‍යතාවයන් හා තාක්ෂණය උපයෝගි කර ගැනීමේ නැඹුරුව
    3) අධ්‍යාපනය හා පුහුණුව
    4) සෞඛ්‍ය අංශයේ වර්ධනය
    5) ICT යටිතල පහසුකම්

48. මානව සංවර්ධන දර්ශකයේ සංරචකයක් වන්නේ,
    1) වැඩිහිටි සාක්ෂරතාවය
    2) උපතේදී ආයු අපේක්ෂණය
    3) ජනගහනයෙන් 1000 කට සිටින වෛද්‍යවරු සංඛ්‍යාව
    4) වසර 12 දි පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කල ජන සංඛ්‍යාව
    5) දෛනික ප්‍රෝටීන පරිභෝජනයේ මධ්‍යයන අගයයි.

49. සේවා නියුක්ති අනුපාතය යනු සේවා නියුක්ත ජන සංඛ්‍යාව
    1) වැඩ කල හැකි වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
    2) සේවා වියුක්ත ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම
    3) ජන සංඛ්‍යාවේ ළමා සහ වයස් ජන සංඛ්යාව අඩු කර ඉතිරි ජන ගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම.
    4) ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම.
    5) සේවා වියුක්ත සහ සේවා නියුත්ක ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම.

50. මෑත වර්ෂයේ ලෝක ආර්ථික පරිහානියට බලපෑ ප්‍රබලම සාධකයක් වන්නේ,
    1) ලෝක මූල්‍ය අර්බුදය
    2) කොවිඩ් 19 වසංගතය
    3) ලෝක තෙල් මිල ඉහල යාම.
    4) රටවල විනිමය අනුපාත ක්ෂය වීම.
    5) රටවල පවතින යුධමය තත්වය

*සියලුම හිමිකම් ඇවිරිණි*

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය 2020**

| | | | | |
|---|---|---|---|---|
| ආර්ථික විද්‍යාව II<br>ECONOMICS II | 21 | S | I I | පැය තුනයි විනාඩි 10 යි |

**උපදෙස් :**

**"අ"සහ "ආ"යන කොටස් දෙකෙන් අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

## "අ" කොටස

01)

I. ආර්ථික සම්පත්වල ප්‍රභේද හතර දක්වා නිදසුනක් බැගින් දක්වන්න.
II. නිදහස් වෙළඳපළ ආර්ථිකයක් මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේ ද?
III. ආර්ථික විද්‍යාවේ දී මුදල් ප්‍රාග්ධන සම්පතක් ලෙස නොසලකන්නේ ඇයි?
IV. ව්‍යවසායකයකු ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් 4 ක් දක්වන්න.
V. වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය මිශ්‍ර ආර්ථිකයක් ලෙස සලකන්නේ ඇයි?

(ලකුණු 4x5 = 20 )

02)

I. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් දැයි දක්වා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේ දී සැලකිල්ලට ගන්නා උපකල්පන කවරේ ද?
II. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පිටතට විතැන් වීමට බලපාන සාධක කවරේ ද?
III. වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය හදුන්වා ඒ සඳහා බලපාන හේතු දක්වන්න.
IV. රෙදි හා ආහාර නිෂ්පාදනයට අදාලව වැඩෙන ආවස්ථික පිරිවැය වක්‍රයක් අඳින්න. එහි පහත සඳහන් දෑ ලකුණු කරන්න.
    අ) වඩා හොඳ පොහොර වර්ගයක් භාවිතා කිරීම.
    ආ) ආහාර නිෂ්පාදනය සඳහා සියළුම සම්පත් යෙදවීම "B"ලෙස ලකුණු කරන්න.
    ඇ) සේවක වැඩ වර්ජනයක් නිසා රෙදි කර්මාන්තය පසු බැමකට ලක්වීම. එය ලෙස"C" ලෙස ලකුණු කරන්න.
V. නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය අතර වෙනස දක්වන්න.

(ලකුණු 4x5 = 20 )

03).

I. භාණ්ඩ වෙළඳපළ හා සාධක වෙළඳපළ අතර වෙනස දක්වන්න.
II. එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.
    i. $Qd = 50 - 5p$
    ii. $Qs = -10 + 5p$
    මෙම සමීකරණ උපයෝගී කරගෙන සමතුලිත මිල හා ප්‍රමාණය නිර්ණය කරන්න.
III. සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න.
IV. නිෂ්පාදකයින්ට රු.8.00 ක සහතික මිලක් ලබා දීමට රජය තීරණය කරන්නේ නම් ඒ වෙනුවෙන් රජයට දැරීමට සිදුවන මුළු පිරිවැය කොපමණ ද?

V. සහතික මිල හඳුන්වා දුන් පසුව පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය කොපමණ ද?

(ලකුණු 4x5 = 20)

04).

I. නිෂ්පාදන ආයතනයක කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස දක්වන්න.

II. හීනවන ඵලදා නීතිය යනු කුමක්දැයි දක්වා කෙටි කාලීන පිරිවැය වක්‍රවල හැඩය පිළිබඳව කුමක් කිව හැකි ද?

III. ගණකාධිකාරි පිරිවැය හා ආර්ථික පිරිවැය යන සංකල්ප එකිනෙකට වෙනස් වන්නේ කෙසේද?

IV. නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය යනු කුමක්දැයි දක්වා නිදසුන් දෙකක් දක්වන්න.

V. නිෂ්පාදන සාධකයක මුළු ඉපයීම්, සංක්‍රාම ඉපයීම් හා මුළු ඉපයීම් ආර්ථික බදු කුලියෙන් සමන්විත වන්නේ කෙසේ දැයි රූප සටහනක් මඟින් පෙන්වන්න.

(ලකුණු 4x5 = 20 )

05).

I. සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට දායක වන ආර්ථික කාරක මොනවා ද? ( ලකුණු 04 )

II. කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබ වෙත සපයා ඇත.

| අයිතමය | රුපියල් මිලියන |
|---|---|
| සේවක ආදායම | 3000 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 4000 |
| ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය | 1000 |
| මිශ්‍ර ආදායම | 2000 |
| ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම | 150 |
| ශුද්ධ විදේශ ජංගම ප්‍රාථමික ආදායම | 200 |
| නිෂ්පාදනය මත ආනයන මත ශුද්ධ බදු | 700 |

ඉහත සඳහන් දත්ත පදනම් කරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

A. මූලික මිල යටතේ දළ එකතු කල අගය (ලකුණු 02)

B. දළ දේශීය නිෂ්පාදනය (ලකුණු 02)

C. දළ ජාතික ආදායම (ලකුණු 02)

D. වැය කල හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)

III. සරල ආර්ථිකයක සමාහාර පාරිභෝජන ශ්‍රිතය C – 100+ 08y ලෙසත් ආයෝජනය I – 200 ලෙසත් සලකන්න.

අ). මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

ආ). සමතුලිත අවස්ථාවේදී ඉතුරුම් මට්ටම කුමක් ද?

ඇ). සමාහාර නිමවුම් මට්ටම රු. බිලියන 1700 ක් වුවහොත් අනිච්ඡානුගත තොග සමුච්චනය කොපමණ ද?

(ලකුණු 3 X 3 = 09)

## "ආ" කොටස

06).

I. රටක ජනතාව මුදල් ලඟ තබා ගැනීමට පෙළඹෙන්නේ කවර හේතු නිසාද? (ලකුණු 03)

II. කිසියම් රටක මුදල් සැපයුම තීරණය වන්නේ කිනම් සාධක මතද? (ලකුණු 04)

III. 10% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් යටතේ කටයුතු කරන වාණිජ බැංකු පද්ධතිය තුල ක්‍රියාත්මක වන එක්තරා වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වගකීම් ( රු.මිලියන) | | වත්කම් (රු. මිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 2000 | සංචිත | 250 |
| | | ණය | 1750 |
| එකතුව | 2000 | | 2000 |

අ) ඉහත බැංකුවට අලුතින් ලබා දිය හැකි ණය ප්‍රමාණය කොපමණද? (ලකුණු 02)

ආ) අලුතින් ණය ලබා දුන් විට මෙම බැංකුවේ ශේෂ පත්‍රය පෙන්වන්න. (ලකුණු 02)

IV. මහ බැංකුවේ අරමුණු හා කාර්යන් මොනවාද ? (ලකුණු 04)

V. අ) උද්ධමනය හා අවධමනය යන සංකල්ප වලින් කුමක් අදහස් වේද? (ලකුණු 02)

ආ) ඉහත තත්වයන් සනාථ කිරිමෙහි ලා ශ්‍රී ලංකාව තුල සකස් කර ඇති මිල දර්ශක කවරේ ද? (ලකුණු 03)

07.

I. පහත සඳහන් දෑ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

අ) ගෝලීය පොදු භාණ්ඩ

ආ) අර්ධ පොදු භාණ්ඩ

ඉ) සුභ සාධක භාණ්ඩ

ඊ) පොදු සම්පත් (ලකුණු 04)

II. ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය එකිනෙකට අනන්‍ය සංකල්ප වේ ද ? පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. රාජ්‍ය අයවැය ලේඛනයක ප්‍රාථමික ගිණුමේ හිඟය හා ශුද්ධ මූල්‍ය හිඟය අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

IV. රජයේ මුළු ආදායමට බදු ආදායමේ දායකත්වය සියයට අසූවට වඩා වැඩිවේ.රජයේ ආදායම තුල බදු නොවන ආදායම් මොනවාද? (ලකුණු 04)

V. නිෂ්පාදනයේ සෘණ බාහිරතා නිසා වෙළඳපළ ක්‍රමය අසාර්ථක වන ආකාරය ප්‍රස්ථාර සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

08.

I. සහල් හා රෙදි පිළි නිෂ්පාදනය කරනු ලබන X හා Y යන රටවල් දෙකෙහි නිෂ්පාදන පිරිවැයට අදාළ දත්ත පෙළක් පහත දැක්වේ.

ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය

| රට | සහල් නිෂ්පාදනය | රෙදිපිළි නිෂ්පාදනය |
|---|---|---|
| X | 4 | 10 |
| Y | 6 | 12 |

අ). සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි ඇත්තේ කිනම් රටකට ද? (ලකුණු 02)

ආ).රෙදි පිළි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඇත්තේ කිනම් රටකට ද? (ලකුණු 03)

II. නිදහස් වෙළඳාම අවහිර කෙරෙන තීරුබදු නොවන සම්බාධක මොනවා ද? (ලකුණු 04)

III. මතු දැක්වෙන තොරතුරු ඇසුරින් සඵල ආරක්ෂණ අනුපාතය ගණනය කරන්න. (ලකුණු 04)

යෙදවුම් වලට තීරු බද්ද 10% කි. තීරු බද්දට පෙර කිසියම් භාණ්ඩයක ආනයන මිල රු.500 කි.එම භාණ්ඩය මත පැනවූ තීරු බද්ද 20% කි.එම භාණ්ඩයේ ආනයනික යෙදවුම් මිල රු. 400 කි. දේශිය වශයෙන් එම භාණ්ඩයේ මිල රු.500 කි.

IV. භාණ්ඩ වෙළඳ අනුපාතය වැඩි වීම කෙරෙහි බලපාන හේතු මොනවා ද? (ලකුණු 04)

V.

අ) .ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු මොනවා ද? (ලකුණු 03)

ආ). 2018 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාව අත්සන් කොට ඇති වෙළඳ ගිවිසුම් මොනවා ද? (ලකුණු 02)

09.

I. ද්විත්ව සටහන් මූලධර්මය අනුව පහත දැක්වෙන ගනුදෙනු ගෙවුම් ශේෂ ලේඛනයක ඇතුළත් කරනු ලබන්නේ කෙසේ ද?

අ). ශ්‍රී ලංකාවේ ඇඟලුම් සමාගමක් මිලියන 500 ක් වටිනා ඇඟලුම් තොගයක් අපනයනය කිරීම. (ලකුණු 02)

ආ). ශ්‍රී ලංකාව විදේශීය රටවලින් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොළිය මිලියන 500 ක් ගෙවීම. (ලකුණු 02)

ඉ). මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකිකයෙක් තම ඥාතීන් වෙත එවනු ලබන ඇමෙරිකන් ඩොලර් 200 ක් (ලකුණු 02)

II. ගෙවුම් ශේෂ ලේඛනයේ දීර්ඝ කාලීන හිඟයක් පවතින විට ඒ සඳහා ඉදිරිපත් කළ හැකි විසඳුම් මොනවා ද? (ලකුණු 04)

III. රටක වෙළඳ අනුපාතය හා වෙළඳ ශේෂය අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

IV. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන හා ආනයන අයිතමයන් හතර බැගින් දක්වන්න. (ලකුණු 04)

V. 1977 න් පසු අපනයන ව්‍යුහයේ වෙනස් වීම් වර්තමානය දක්වා වෙනස් වී ඇති ආකාරය දක්වන්න. (ලකුණු 02)

10.

I. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර තරඟකාරිත්වය ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 05)

II. ආර්ථික වෘද්ධිය යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

III. ආර්ථික වෘද්ධිය හට ගැනීමට බලපාන හේතු දක්වන්න. (ලකුණු 04)

IV. ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා බලපාන ප්‍රධාන බාධක කවරේද? (ලකුණු 04)

V. මෑත වර්ෂවල දී ශ්‍රී ලංකා රජය ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේ ද? (ලකුණු 05)